රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක:- 217

මගේ අංකය:-2/9/771(එච්)1 වෙළුම
රාජ්‍ය පරිපාලන අමාත්‍යාංශය,
නිදහස් චතුරශ්‍රය,
කොළඹ 07.
1983.03.3

සියළුම අමාත්‍යාංශ ලේකම්වරුන්,
දෙපාර්තමේන්තු ප්‍රධානීන් සහ
රාජ්‍ය සංස්ථා ප්‍රධානීන් වෙතටයි.

තනතුර අත්හැර ගොස් පසුව සේවයෙහි
නැවත පිහිටවූ/සේවයෙහි නැවත යොදවන ලද
රජයේ නිලධරයින්/සංස්ථා සේවකයින්.

---

1980 ජූලි මාසයේදී තනතුර අත්හැර ගියා සේ සලකනු ලැබ, අමාත්‍ය මණ්ඩලය නියම කළ උපදෙස් අනුව සමාලෝචනයකින් පසුව නැවත සේවයෙහි පිහිටුවන ලද/නැවත සේවයෙහි යොදවන ලද - විශේෂයෙන් ම තනතුර අත්හැරිය අවස්ථාවේදී සේවයෙහි යෙදී සිටිය කාර්යාලවල ම, නැවත සේවයෙහි පිහිටුවන ලද/නැවත සේවයෙහි යොදවන ලද - සමහර රජයේ නිලධරයින්/සංස්ථා සේවකයින්, විනය විරෝධී ලෙස හැසිරෙන බවට නියෝජන ලැබී ඇත. ඇතැම් අවස්ථාවලදී මෙයින් එම ආයතනවල යහපත් ආකාරයකින් කටයුතු කිරීම කෙරෙහි තරමක අහිතකර ලෙස බලපෑමක් ඇති වී ඇත.

02. කරුණාකර එවැනි තත්ත්වයන් පිළිබඳව විමසිල්ලෙන් සිටින ලෙස ද, අවශ්‍ය වුවහොත් විනයානුකූලව කටයුතු කරන ලෙස හෝ නැති නම් හැකි අවස්ථාවලදී එවැනි රජයේ නිලධරයකු/සංස්ථා සේවකයකු ස්ථාන මාරු කිරීමට හෝ කටයුතු කරන ලෙසද කරුණාවෙන් දන්වමි.

Siriwardhana
බී.බී.අයි.පී.එස්.සිරිවර්ධන,
ලේකම්,
රාජ්‍ය පරිපාලන අමාත්‍යාංශය.